# අ.පො.ස. ( සා.පෙළ ) පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2018
## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය (81) - I, II

මෙය අධ්‍යාපන අමාත්‍යාංශයේ කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාවේ මෙහෙයවීමෙන් සකස් කරන ලද්දකි.

පැය තුනයි

**උපදෙස් :**
- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ** පිළිතුර තෝරාගෙන, **එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් කෘෂිකාර්මිකව වැදගත් ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන, 2018 අප්‍රේල් මස 19 වන දින රෝමයේ දී ප්‍රකාශයට පත් කරන ලද්දේ, ශ්‍රී ලංකාවේ,
(1) සීගිරි රාජධානිය ආශ්‍රිත උද්‍යානය යි. (2) පලුගස්වැව එල්ලංගා වැව් ගම්මානය යි.
(3) හෝර්ටන් තැන්න ජාතික වනෝද්‍යානය යි. (4) සිංහරාජ නිවර්තන වැසි වනාන්තරය යි.

**2.** වර්ෂාපතනය හා සුළගේ වේගය මනිනු ලබන සම්මත ඒකක පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) සෙන්ටිමීටර් හා පැයට කිලෝ මීටර් (2) මිලි මීටර් හා පැයට කිලෝ මීටර්
(3) මිලි ලීටර් හා තත්පරයට මීටර් (4) මිලි ලීටර් හා පැයට කිලෝ මීටර්

**3.** බෝග වගාව කෙරෙහි දේශගුණික සාධකවල බලපෑම පිළිබඳව ඇති ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.

A - අල බෝගවල ආකන්ධ වර්ධනය සඳහා දිවා කාලයේ වැඩි උෂ්ණත්වයක් සහ රාත්‍රී කාලයේ අඩු උෂ්ණත්වයක් තිබීම හිතකර වේ.
B - කැරට් හා බීට්වල පුෂ්ප පිපීම සිදුවන්නේ එම ශාක අඩු උෂ්ණත්වයකට පාත්‍ර වූ විට ය.
C - දඬු කැබලි මුල් ඇද්දවීමට පරිසරයේ සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩි වීම හිතකර වේ.

මෙම ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A හා C පමණි. (4) A, B හා C ය.

**4.** පාංශු වර්ණය පසේ වැදගත්වන භෞතික ලක්ෂණයකි. පාංශු වර්ණය පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - යකඩ අධික පස රතු පැහැයට හුරු වේ.
B - ජලවහනය දුර්වල ස්ථානවල පස අඳුරු කහ වර්ණයක් ගනියි .
C - කැල්සියම් අධික පස කළු පැහැයට හුරු වේ.
මෙම ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

(1) A හා C පමණි. (2) B හා C පමණි. (3) A හා B පමණි. (4) A, B හා C ය.

**5.** පස් නියැදියක්, විෂ්කම්භය 0.2mm ක පෙනේරයකින් හැලූ විට පෙනේරය මත ඉතිරි වන්නේ,
(1) රළු වැලි හා බොරළු ය. (2) සියුම් වැලි හා රළු වැලි ය.
(3) රොන්මඩ හා සියුම් වැලි ය. (4) මැටි හා රොන්මඩ ය.

**6.** පසක් සංතෘප්ත අවස්ථාවේ සිට ක්ෂේත්‍ර ධාරිතාවට පත්වීමේ දී පසෙන් ඉවත්වන ජල ආකාරය/ ආකාර වන්නේ,
(1) ජලාකර්ෂණ ජලය යි. (2) කේෂාකර්ෂණ ජලය යි.
(3) ගුරුත්වාකර්ෂණ ජලය යි. (4) ජලාකර්ෂණ හා ගුරුත්වාකර්ෂණ ජලය යි.

**7.** A හා B ලෙස නම් කළ පස් නියැදි දෙකක රසායනික ලක්ෂණ පහත වගුවේ දැක්වේ.
මෙම පස් වර්ග පිළිබඳව ඇති පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) A පස ක්ෂාරීය වන අතර සාරවත් බවින් අඩු ය.
(2) B පස ක්ෂාරීය වන අතර සාරවත් බවින් වැඩි ය.
(3) A පස ආම්ලික වන අතර සාරවත් බවින් වැඩි ය.
(4) B පස ආම්ලික වන අතර සාරවත් බවින් අඩු ය.

| පස් වර්ගය | pH අගය | කැටායන හුවමාරු ධාරිතාව (පස් 100 g කට මිලි සමක) |
|---|---|---|
| A | 4.8 | 16 |
| B | 8.0 | 50 |

(දෙවැනි පිටුව බලන්න.)

**8.** පහත දැක්වෙන්නේ අමාලිගේ මව විසින් වෙළඳපොලෙන් මිල දී ගෙන එන ලද එළවළු මල්ලක අඩංගු එළවළු වර්ග කීපයකි. අමාලි එහි ඇති එළවළු කුල අනුව වෙන් කර වගුවකට ඇතුළත් කළා ය. එම එළවළු අයත්වන කුල නිවැරදිව දක්වා ඇත්තේ වගුවේ කුමන පේළියේ ද?

| | ෆැබේසියේ | කුකබිටේසියේ | මැල්වේසියේ | ඇමරිලිඩේසියේ | සොලනේසියේ |
|---|---|---|---|---|---|
| 1 | වැටකොළු | අමු මිරිස් | බණ්ඩක්කා | අර්තාපල් | ලොකු ලූණු |
| 2 | බෝංචි | වැටකොළු | බණ්ඩක්කා | ලොකු ලූණු | අමු මිරිස් |
| 3 | අර්තාපල් | ලොකු ලූණු | වැටකොළු | බෝංචි | බණ්ඩක්කා |
| 4 | අමු මිරිස් | බණ්ඩක්කා | බෝංචි | වැටකොළු | අර්තාපල් |

**9.** හෙක්ටාර දෙකක පමණ භූමියක ඉන්නල වගාවක් සඳහා ඇලි හා වැටි සකස් කිරීමට ගොවි මහතෙකුට අවශ්‍ය විය. ඒ සඳහා ඔහු භාවිත කළ යුතු වඩාත් සුදුසු උපකරණය වන්නේ,

(1) ජපන් පරිවර්ත්‍ය නගුල යි. (2) හැඩ ලැලි නගුල යි. (3) තැටි නගුල යි. (4) රිජරය යි.

**10.** බෝග වගා කිරීම සඳහා ද්විතියික බිම් සැකසීමේ ප්‍රධාන පරමාර්ථයක් වන්නේ,

(1) පස් කැපීම හා පෙරළීම ය. (2) තරගකාරී වල් පැළ විනාශ කිරීම ය.
(3) වගාවට යෝග්‍ය මතුපිට පස් ස්තරයක් සැකසීම ය. (4) අහිතකර ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීම ය.

**11.** අලෙවි කිරීම සඳහා මිරිස් පැළ නිෂ්පාදනයට වඩාත් සුදුසු තවාන් වර්ගය වන්නේ,

(1) උස් තවාන් පාත්ති ය. (2) ගිල් වූ තවාන් පාත්ති ය. (3) තවාන් බඳුන් ය. (4) තවාන් තැටි ය.

**12.** බිංදු ජල සම්පාදනය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - අනෙක් ජල සම්පාදන ක්‍රම හා සසඳන විට අවශ්‍ය මූලික වියදම වැඩි ය.
B - අඩු ජල ප්‍රමාණයකින් බෝග ජල අවශ්‍යතාව සැපයිය හැකි ක්‍රමයකි.
C - මූල මණ්ඩලයට ආසන්නව කෙලින්ම ජලය ලබා දිය හැකි ක්‍රමයකි.
D - වැලි අධික පස්වලට එතරම් යෝග්‍ය නොවේ.

ඉහත වගන්ති අතරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A, B, හා C පමණි. (2) A, C, හා D පමණි. (3) A, B, හා D පමණි. (4) B, C හා D පමණි.

**13.** පසට ලැබෙන ජලය පස තුළින් පසේ ගැඹුරට ගමන් කිරීම (ගැඹුරු වැස්සීම) වැඩිපුරම සිදුවන පස වනුයේ,

(1) මැටි පස ය. (2) වැලි පස ය. (3) ලෝම පස ය. (4) වැලි ලෝම පස ය.

**14.** අත්‍යවශ්‍ය මහා පෝෂක ඌනතා ලක්ෂණ පෙන්වන ශාක කිහිපයක් සිසුන්ට පෙන් වූ ඔවුන්ගේ ගුරුතුමිය, එම ඌනතා ලක්ෂණ ඇසුරින් පෝෂක ඌනතා හඳුනා ගැනීමට ඔවුන්ට අවස්ථාව ලබා දුනි.

A - පරිණත පත්‍ර කහ පැහැ වී ඇති දොඩම් ශාකයක්
B - පත්‍ර අග්‍ර දම් පැහැයට හුරු තද කොළ පැහැති වී ඇති බඩ ඉරිඟු ශාකයක්
C - පත්‍ර අග්‍රවල හරිතක්ෂය සිදු වී ක්‍රමයෙන් දුඹුරු පැහැ ගැන්වී ඇති බෝංචි ශාකයක්

මෙහි A, B, හා C නිදර්ශකවලින් පෙන්වන ඌනතා ලක්ෂණ ප්‍රධාන වශයෙන් දැකිය හැක්කේ පිළිවෙලින් කුමන පෝෂක හිඟ වූ විට ද?

| | A | B | C |
|---|---|---|---|
| (1) | පොටෑසියම් | නයිට්‍රජන් | පොස්පරස් |
| (2) | පොස්පරස් | පොටෑසියම් | නයිට්‍රජන් |
| (3) | නයිට්‍රජන් | පොටෑසියම් | පොස්පරස් |
| (4) | නයිට්‍රජන් | පොස්පරස් | පොටෑසියම් |

**15.** පූර්ණ පොහොර මිශ්‍රණයක් යනු,

(1) ප්‍රධාන ශාක පෝෂක තුනෙන් එකක් පමණක් සැපයෙන පොහොර වේ.
(2) ප්‍රධාන ශාක පෝෂක එකකට වැඩි ගණනක් සැපයෙන පොහොර වේ.
(3) ප්‍රධාන පෝෂක තුනම අඩංගු කර සකසන ලද මිශ්‍රණයකි.
(4) ප්‍රධාන පෝෂක තුනෙන් දෙකක් පමණක් අඩංගු මිශ්‍රණයකි.

(තෙවැනි පිටුව බලන්න)

**16.** A, B, හා C ලෙස නම් කළ ඍජු රසායනික පොහොර වර්ග තුනක භෞතික ලක්ෂණ පහත වගුවේ දක්වා ඇත.

| A | B | C |
|---|---|---|
| • සුදු පැහැති ය. | • ලා අළු පැහැති ය. | • රතු දුඹුරු පැහැති ය. |
| • ගෝලාකාර කැට වේ. | • ගෝලාකාර කැට වේ. | • කුඩා ස්ඵටික වේ. |
| • ජලයේ හොඳින් දිය වේ. | • ජලයේ මඳක් දිය වේ. | • ජලයේ හොඳින් දිය වේ. |

ඉහත දැක්වෙන පරිදි A, B, හා C පිළිවෙලින් විය හැක්කේ,

(1) යූරියා, ත්‍රිත්ව සුපර් පොස්ෆේට් හා මියුරියේට් ඔෆ් පොටෑෂ් ය.
(2) මියුරියේට් ඔෆ් පොටෑෂ්, ඇමෝනියම් සල්ෆේට් හා සුපර් පොස්ෆේට් ය.
(3) ත්‍රිත්ව සුපර් පොස්ෆේට්, යූරියා හා සල්ෆේට් ඔෆ් පොටෑෂ් ය.
(4) යූරියා, ත්‍රිත්ව සුපර් පොස්ෆේට් හා ඇමෝනියම් සල්ෆේට් ය.

**17.** වල් පැළෑටියක රූපීය ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- පත්‍ර සිහින් ය, දිග ය, පත්‍රවල සමාන්තර නාරටි වින්‍යාසයක් ඇත.
- කඳ ත්‍රිකෝණාකාර ය, කඳ ඇතුළත කුහරයක් නැත.
- කඳේ අග්‍රස්ථයේ හට ගන්නා පුෂ්ප මංජරිය දිශා තුනකට බෙදී ඇත.

පහත සඳහන් වල් පැළෑටි අතරින් මෙම රූපීය ලක්ෂණ ඇතුළත් වල් පැළෑටිය වන්නේ,

(1) මොණර කුඩුම්බිය ය. (2) බටදැල්ල ය. (3) ඉලුක් ය. (4) තුනැස්ස ය.

**18.** පහත දැක්වෙන්නේ කුකර්බිටේසියේ කුලයේ බෝගවලට බහුලව හානි කරන කෘමියෙකුගේ රූපයකි.
මෙම කෘමියා විය හැක්කේ,



(1) අවුලකපෝරා ය. (2) ඉල් මැස්සා ය.
(2) රතු පොල් කුරුමිණියා ය. (4) එපිලැක්නා ය.

**19.** වගා බිමේ මායිම්වල හා පාත්ති අතර කෘමි විකර්ශක ශාක සිටුවීමෙන් කෘමීන් විකර්ශණය වේ. මේ සඳහා නිදසුන් අඩංගු නිවැරදි වරණය තෝරන්න.

(1) දාස්පෙතියා, ඉපිල්ඉපිල්, ග්ලිරිසීඩියා සහ එරබදු.
(2) සූරියකාන්ත, දාස්පෙතියා, ආඩතෝඩා සහ මදුරුතලා.
(3) එරබදු, සූරියකාන්ත, ඇහැළ සහ කොහොඹ.
(4) අරලිය, කනේරු, කොහොඹ සහ ග්ලිරිසීඩියා.

**20.** දුඹුරු පැළ කීඩෑවාට ප්‍රතිරෝධී වී ප්‍රභේද දෙකකි,

(1) Bg – 300, Bg – 379 – 2. (2) PTB – 16, පොඩි වී A 8.
(3) Bw – 351, Bg 450. (4) Bg 3 – 5, Bg 4.

**21.** ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් වී නිෂ්පාදනය කරන දිස්ත්‍රික්ක වනුයේ ,

(1) පොළොන්නරුව, කුරුණෑගල, හම්බන්තොට හා නුවරඑළිය යි.
(2) අම්පාර, මඩකලපුව, අනුරාධපුරය හා කළුතර යි.
(3) අම්පාර, මඩකලපුව, පොළොන්නරුව හා අනුරාධපුරය යි.
(4) කුරුණෑගල, රත්නපුර, අම්පාර හා මඩකලපුව යි.

**22.** අපිභෞම බීජ ප්‍රරෝහණයේ දී සිදු වන්නේ,

(1) බීජයෙහි, බීජාධරය බීජෝපරියට වඩා වේගයෙන් වර්ධනය වීම ය.
(2) බීජයෙහි, බීජෝපරිය බීජාධරයට වඩා වේගයෙන් වර්ධනය වීම ය.
(3) බීජයෙහි, බීජාධරයත් බීජෝපරියත් එකම වේගයෙන් වර්ධනය වීම ය.
(4) බීජයෙහි, බීජාධරයට වඩා වේගයෙන් බීජාංකුරය වර්ධනය වීම ය.

(හතරවැනි පිටුව බලන්න .)

**23.** බීජ ප්‍රරෝහණය හා සම්බන්ධ සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සහතික කරන ලද බිත්තර වීවල ප්‍රරෝහණ ප්‍රතිශතය 75% ක් වේ.
(2) හිතකර පරිසර තත්ත්ව ඇති වූ විට සුප්ත බීජ ඉක්මනින් ප්‍රරෝහණය වේ.
(3) සලාද බීජ ප්‍රරෝහණය සඳහා ආලෝකය ද අත්‍යවශ්‍ය සාධකයක් වේ.
(4) සෑම බීජයක්ම ප්‍රරෝහණය සඳහා උෂ්ණත්වයේ බලපෑමක් නොමැත.

24. පහත සඳහන් ශාක අතරින්, වර්ධක ප්‍රචාරණයේ දී ලා දඬු කැබලි සිටුවා ගනු ලබන ශාක කාණ්ඩය වන්නේ,
(1) රෝස, වද හා ක්‍රෝටන් වේ.   (2) වද, රෝස හා බතල වේ.
(3) බතල, ඉන්නල හා කොලියාස් වේ.   (4) මඤ්ඤොක්කා, රෝස හා කෝලියාස් වේ.

25. ඒකීය සූර්ය ප්‍රචාරකයක දඬු කැබලි මුල් ඇද්දවීම හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - රෝපණ මාධ්‍ය ලෙස, වැලි: කොම්පෝස්ට්: මතුපිට පස්, 1:1:1 අනුපාතයට යොදා ගැනීම සුදුසු ය.
B - දඬු කැබැල්ල සිටුවීමට ගන්නා පොලිතීන් බඳුනේ ජලවහන සිදුරු සෑදිය යුතු ය.
C - ඒකීය සූර්ය ප්‍රචාරකය සඳහා ගන්නා පොලිතීන් බඳුනේ උසින්, ¾ ක් පමණ රෝපණ මාධ්‍ය පිරවිය යුතු ය.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

(1) B හා C පමණි.   (2) B පමණි.   (3) A හා B පමණි.   (4) A පමණි.

26. සිරස් වගා මලු තුළ කෙරෙන නිර්පාංශු වගාවේ දී රෝපණ මාධ්‍ය ලෙස යෙදීමට වඩාත් සුදුසු වන්නේ,
(1) කොහු බත් ය.   (2) දහයියා ය.   (3) ගල් කුඩු ය.   (4) කොහු කෙඳි ය.

27. ගොවිමහතෙක් තම වගා භූමියෙහි පළමුව එළවළු වගා කළ අතර, ඊළඟ කන්නයේ දී අල බෝග ද, අල බෝග අවසන් වූ පසු මාෂ බෝග ද වගා කළේ ය. මෙම වගා ක්‍රමය හඳුන්වනු ලබන්නේ,
(1) ශෂ්‍ය බෝග මාරුව වශයෙනි.   (2) මිශ්‍ර බෝග වගාව වශයෙනි.
(3) අතුරු බෝග වගාව වශයෙනි.   (4) කඩින් කඩ බෝග වගාව වශයෙනි.

28. අතුරු බෝග වගාව ලෙස හැඳින්වෙන බෝග වගා රටාවේ දී ,
(1) ක්ෂේත්‍රයක බෝග වර්ග දෙකක් මාරුවෙන් මාරුවට වගා කෙරේ.
(2) ක්ෂේත්‍රයක එක් බෝගයක් පමණක් අඛණ්ඩව වගා කෙරේ.
(3) ප්‍රධාන බෝගයක් වගා කර, එම බෝගය අතර වෙනත් බෝග වර්ග එකක් හෝ කිහිපයක් වගා කෙරේ.
(4) එක් බෝගයක් වගා කර, එහි අස්වැන්න නෙළීමට ආසන්න කාලයේ දී තවත් බෝගයක් ස්ථාපනය කෙරේ.

29. පරිණත අවධියට පසුව අස්වනු නෙළීම නිසා, තන්තුමය ස්වභාවය වැඩි වීම හා අඩු වීම පෙන්නුම් කරන බෝග වර්ග පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?
(1) ලීක්ස් හා මුරුංගා ය.   (2) කැරට් හා වැටකොළු ය.
(3) බණ්ඩක්කා හා මෑ ය.   (4) බෝංචි හා තක්කාලි ය.

30. දීර්ඝ වියළි කාලයකට පසුව, පසට ජලය ලැබුණු විට අර්තාපල් බෝගවල අස්වැන්නට සිදුවන හානියක් වන්නේ,
(1) දිලීර රෝග ව්‍යාප්ත වීම ය.
(2) අලවල පොළොව මතුපිට ඇති කොටස කොළ පැහැති වීම ය.
(3) අල පැලීම ය.
(4) අල විකෘති වීම ය.

31. විටමින් යනු, මානව පෝෂණයේ දී වැදගත් වන පෝෂණ සංඝටකයකි. විටමින් පිළිබඳව වඩාත්ම නිවැරදි වගන්ති තෝරන්න.
A - විටමින් යනු අකාබනික සංයෝග වේ.
B - විටමින් B හා C ජල ද්‍රාව්‍ය විටමින වර්ග වේ.
C - විටමින් K රුධිරය කැටි ගැසීමට වැදගත් වේ.

(1) A හා B ය.   (2) A හා C ය.   (3) B හා C ය.   (4) A, B හා C ය.

32. යෝගට්, විනාකිරි හා වයින් නිෂ්පාදනයේ දී යොදා ගැනෙන ආහාර පරිරක්ෂණ ක්‍රමය වන්නේ,
(1) සාන්ද්‍රීකරණය යි.   (2) පැසවීම යි.   (3) පැස්ටරීකරණය යි.   (4) ජීවාණුහරණය යි.

(පස්වැනි පිටුව බලන්න.)

33. සාමාන්‍ය ලුණු සමඟ අයඩීන් මිශ්‍ර කර වෙළඳපොලට ඉදිරිපත් කිරීම හඳුන්වන්නේ,

(1) ආහාර සරු කිරීම ලෙස ය. (2) ආහාර ප්‍රබල කිරීම ලෙස ය.
(3) ආහාර අවම සැකසීම ලෙස ය. (4) ආහාර පරිරක්ෂණය ලෙස ය.

34. ආහාර නරක් වීමට බලපාන භෞතික සාධකයක් වන්නේ,

(1) ආහාරයේ අඩංගු තෙතමන ප්‍රමාණය වේ.
(2) ආහාරයට බාහිර පරිසරයෙන් ඇතුළුවන ක්ෂුද්‍රජීවීන් ය.
(3) ආහාරයට යොදා ඇති කෘෂි රසායන ද්‍රව්‍ය වේ.
(4) ආහාරයේ අඩංගු බැර ලෝහ වේ.

35. විදේශීය සම්භවයක් ඇති, කිරි ලබා ගැනීම සඳහා ඇති කරනු ලබන මී ගව වරිග තුනකි,

(1) තර්පකාර්, කිලාරි හා කන්ගායම්. (2) මුරා, සූර්ති හා නිලිරවි.
(3) හරියානා, කිලාරි හා නිලිරවි. (4) කිලාරි, හරියානා හා සූර්ති.

36. පහත රට තෙත් කලාපය සඳහා නිර්දේශ කර ඇති එළ ගව වරිග කිහිපයකි,

(1) ෆ්‍රිෂියන්, ජර්සි හා අයර්ෂයර්. (2) ජර්සි, අයර්ෂයර් හා AMZ.
(3) සහීවාල්, ජර්සි හා AMZ. (4) සහීවාල්, සින්දි හා ෆ්‍රිෂියන්.

37. ගොවියෙක් කිරි දෙවීමට ප්‍රථම දෙනගේ බුරුල්ල නිරීක්ෂණය කර, තන පුඩු හතරෙන් කිරි ස්වල්පය බැගින් කලු රෙදි කැබැල්ලකට දොවා පරීක්ෂා කළේ ය. ඔහුට මෙමගින් එළදෙනට කුමන රෝගය වැළඳී ඇති දැයි නිගමනය කළ හැකි ද?

(1) මැස්ටයිටිස් රෝගය (2) කිරි උණ රෝගය (3) රක්තාශ්‍රව රෝගය (4) කාලගාත්‍රා රෝගය

38. කුකුළු පාලනයේ විවිධ අවස්ථාවල දී පිටලෑම සිදු කරනු ලැබේ. බිත්තර දමන අවධියේ පසු වන කිකිළියන් පිටලෑම හා සම්බන්ධ නිවැරදි වගන්තිය කුමක් ද?,

(1) අපිරිසිදු හා පළුදු වූ පියාපත් සහිත කිකිළියන් පිටලෑමට සුදුසු ය.
(2) පිටලෑම මගින් කුකුළු ව්‍යාපාරයේ ලාභය අඩු වේ.
(3) පිටලෑම මගින් ආහාර සඳහා යන වියදම වැඩි වේ.
(4) කුකුළු පට්ටියේ රෝග බෝවීමේ අවදානම පිටලෑම මගින් අඩු කර ගත හැකි ය.

39. ඇතැම් ආහාර පරිරක්ෂණයේ දී, ආහාර ඇසුරුම තුළ ඇති ඔක්සිජන් වායුව ඉවත් කර, ඒ වෙනුවට වෙනත් වායු ඇතුල් කරනු ලැබේ. එම වායු නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පොස්ෆීන් හා කාබන්ඩයොක්සයිඩ් ය.
(2) කාබන්ඩයොක්සයිඩ් හා නයිට්‍රජන් ය.
(3) නයිට්‍රජන් හා පොස්ෆීන් ය.
(4) පොස්ෆීන් හා මීතයිල් බ්‍රෝමයිඩ් ය.

40. කිරි හා කිරි නිෂ්පාදනවලට වෙනත් ද්‍රව්‍ය මිශ්‍ර කර ඇත්දැයි හඳුනා ගැනීම පිණිස කරන ලද පරීක්ෂණයක දී ලබා ගත් නිරීක්ෂණ පහත දැක්වේ.

| | **පරීක්ෂණය** | **නිරීක්ෂණය** |
|---|---|---|
| A | දියර කිරි නියැදියකට ග්ලිසරින් බිංදු දෙකක් දමන ලදී. | කිරි රතු පැහැ විය. |
| B | කිරි පිටි නියැදියකට අයඩීන් දියර ස්වල්පයක් දමන ලදී. | සාම්පලය නිල් දම් පැහැ විය. |

මේ අනුව නිගමනය කළ හැක්කේ, දියර කිරිවලට හා කිරි පිටිවලට එක්කර ඇති ද්‍රව්‍ය පිළිවෙළින්,

(1) සීනි හා ලුණු ය.
(2) කිරි පිටි හා පිටි කළ පොල් කිරි ය.
(3) ජලය හා තිරිඟු පිටි ය.
(4) පොල් කිරි හා තිරිඟු පිටි ය.

## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය II

❖ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**01.** දේශීය ආහාර නිෂ්පාදනයට හා පාරිභෝජන රටාවට දරුවන් හුරු කරවීමත්, පරිසරයට සංවේදී අනාගත පරපුරක් බිහිකිරීමත් යන අරමුණු පෙරදැරිව ක්‍රියාත්මක කෙරෙන, "තිරසර පාසල් වැඩසටහන" නම් වූ, දීපව්‍යාප්ත වැඩසටහන යටතේ උතුරුමැද පළාතේ එක්තරා පාසලක ගොවිපොළක් ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ.

i. මෙම ප්‍රදේශයේ යල කන්නයේ දී, ජලය හිඟවන බැවින් පාංශු ජලය සංරක්ෂණය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

ii. මෙම ප්‍රදේශයේ බෝග වගා කිරීමේ දී බලපාන දේශගුණික සාධක දෙකක් නම් කරන්න. එම සාධක මැනීම සඳහා භාවිත කරන උපකරණය බැගින් සඳහන් කරන්න.

iii.
(a) මෙම පළාතේ බහුලව ව්‍යාප්ත වී ඇති පස් කාණ්ඩය නම් කරන්න.
(b) මෙම පස තෙත් කලාපයේ පවතින පස් කාණ්ඩවලට වඩා සාරවත් වීමට හේතුවක් සඳහන් කරන්න.

iv. මෙම ගොවිපොළේ ඉන්නල, ඉඟුරු, කිරි අල හා ගොටුකොළ යන බෝග වගා කිරීම සඳහා භාවිත කළ හැකි වර්ධක ප්‍රචාරක ව්‍යුහ වෙන් වෙන්ව සඳහන් කරන්න.

v. වැටකොළු හා කරවිල අයත්වන කුලයේ බෝගවල ඵලවලට බහුලව හානි කරන පළිබෝධයකු නම් කර, එම හානිය වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි පරිසර හිතකාමී ක්‍රම දෙකක් සඳහන් කරන්න.

vi. මෙම ප්‍රදේශයේ බහුලව දක්නට ලැබෙන ආගන්තුක ආක්‍රමණශීලී වල් පැළෑටි දෙකක් නම් කරන්න.

vii. මෙම පාසලේ වැසි ජල සංරක්ෂණ ටැංකියක් පිහිටුවීමෙන් ලැබෙන වාසි දෙකක් ලියන්න.

viii. මෙම ගොවිපොළේ කිරි ලබා ගැනීම සඳහා ගව දෙනක් ඇති කරනු ලැබේ. ගව දෙන පෝෂණය සඳහා ලබා දීමට සුදුසු සාන්ද්‍ර ආහාර වර්ගයක් හා දළ ආහාර වර්ගයක් නම් කරන්න.


ix. එම ගවදෙනගෙන් ලැබෙන කිරි පාසලේ දී පරිරක්ෂණය කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රම දෙකක් ලියන්න.

x. මෙම ගොවිපොළෙහි ජීව වායු ඒකකයක් පිහිටුවීමට අදහස් කර ඇත. එමගින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

**02.** (i) බෝග වගාකිරීමේ දී ප්‍රශස්ත අස්වැන්නක් ලබා ගැනීමට බෝගවලට සුදුසු පරිසර සාධක ලබාදීමත් පාංශු ලක්ෂණ මනාව පවත්වා ගැනීමත් අවශ්‍ය වේ.

(a) රූපසටහනේ දැක්වෙන උපකරණය භාවිත කරනු ලබන්නේ, කුමන කාලගුණික පරාමිතිය මැනීම සඳහා ද?

(b) එම උපකරණයෙහි, A හා B යන කොටස් නම් කරන්න.




(ii)(a) බෝග වගාව කෙරෙහි, සුළඟේ හිතකර බලපෑම් දෙකක් ලියන්න.

(b) ලංකාවේ විවිධ ප්‍රදේශවල උෂ්ණත්වය වෙනස් වීමට බලපාන සාධක දෙකක් ලියන්න

(iii)(a) පසක අඩංගු විවිධ විශාලත්වයෙන් යුතු, පාංශු ඛනිජ අංශුවල සාපේක්ෂ ව්‍යාප්තිය අනුව නිර්ණය කෙරෙන පාංශු ලක්ෂණය කුමක්ද?

(b) පසක ව්‍යුහය විනාශ වන ආකාර දෙකක් සඳහන් කරන්න.

(c) පසට කාබනික ද්‍රව්‍ය එක් කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

**03.** තවාන් පැළ ක්ෂේත්‍රයේ සිටුවීමෙන් පසු, මනා ජල සම්පාදනය හා පොහොර යෙදීම මගින් ප්‍රශස්ත තත්ත්වයේ වගාවක් පවත්වා ගත හැකි වේ.

(i) (a) බෝගයක් ක්ෂේත්‍රයේ සංස්ථාපනය කිරීමේ දී තවාන් දමා පැළ සිටුවීම මගින් අත්වන වාසි දෙකක් සඳහන් කරන්න.

(b) තක්කාලි හා මිරිස් ආදී බෝගවල, බීජ තවාන් නොදමා කෙලින්ම ක්ෂේත්‍රයේ සිටුවීමෙන් ඇතිවිය හැකි ගැටළුවක් සඳහන් කරන්න.

(ii) (a) බෝග සඳහා ජල සම්පාදනය කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න.

(b) බෝග වගා භූමියක පාංශු ජලය සංරක්ෂණය සඳහා සුදුසු පරිසර හිතකාමී ක්‍රමයක් යෝජනා කරන්න.

(iii) (a) බෝගවලට පොහොර යොදනු ලබන ප්‍රධාන අවස්ථා දෙක සඳහන් කරන්න.

(c) මිශ්‍ර පොහොර වෙනුවට ඍජු පොහොර භාවිතයෙන් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න.

**04.** බීජ ප්‍රරෝහණය උත්තේජනය කිරීම හෝ වෙනත් ශාක වර්ධක කොටස් මුල් ඇදීම උත්තේජනය කිරීමට සූර්ය ප්‍රචාරක යොදා ගැනේ.

(i) (a) ඒකීය සූර්ය ප්‍රචාරකයක් ඇඳ එහි කොටස් නම් කරන්න.


(b) දඬු කැබලි මනාව මුල් ඇදීම සඳහා සූර්ය ප්‍රචාරකයක තිබිය යුතු ප්‍රධාන පරිසර තත්ත්ව සඳහන් කරන්න.

(ii) පහත දැක්වෙන්නේ ඒක බීජ පත්‍රී බීජයක දික්කඩකි.

(a) මෙම රූප සටහනේ A,B,C හා D යන කොටස් නම් කරන්න.

(b) මෙම බීජය ප්‍රරෝහණයට අවශ්‍ය ආහාර සංචිත කර ඇති කොටස කුමක් ද?

(c) බීජ ප්‍රරෝහණයට අවශ්‍ය වන සාධක සඳහන් කරන්න.




(iii) (a) පස් වෙනුවට, වෙනත් රෝපණ මාධ්‍යයක් යොදා සිදු කරනු ලබන වගාව කුමන නමකින් හැඳින්වේ ද?

(b) මෙහිදී, භාවිත කරනු ලබන පෝෂණ ද්‍රාවණ වර්ග දෙකක් සඳහන් කරන්න.

(c) මෙම ක්‍රමයේ දී යොදා ගන්නා රෝපණ මාධ්‍යයේ තිබිය යුතු ලක්ෂණ දෙකක් දක්වන්න.

**05**. ගොවිපොළක එක් වගා කන්නයක් තුළ දී, පහත සඳහන් ක්‍රියාකාරකම් හා සිදුවීම් දකින්නට ලැබුණි.

A. සහතික කරන ලද බීජ වර්ග සිටුවීම
B. කරවිල වගාවේ ඉල්මැසි හානිය දක්නට ලැබීම
C. මිරිස් වගාවේ තැනින් තැන කොළ කොඩ වීම
D. නෙලූ අඹ අස්වැන්න නොසෝදා ඇසිරීම
E. හොඳින් ඉදුනු පසු, කෙසෙල් අස්වැන්න නෙළීම

(i) (a) ඒවා අතරින්, මෙම ගොවිපොළෙහි බෝග අස්වැන්නේ පෙර අස්වනු හානි සිදුවිය හැකි සිදුවීම් දෙකක් සඳහන් කරන්න.

(b) ඉහත තොරතුරු අනුව, පසු අස්වනු හානියට හේතු විය හැකි ක්‍රියාකාරකමක් නම් කර, එම හානිය අවම කරගන්නා එක් ආකාරයක් ලියන්න.

(ii) (a) ඉහත ගොවිපොළේ, එළවළු හා පලතුරු පරිරක්ෂණය කරන්නේ නම්, එයින් ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

(b) පලතුරු ජෑම් නිෂ්පාදනයේ දී, ඇතැම් අවස්ථාවල එක් කරනු ලබන පහත සඳහන් ද්‍රව්‍යවල වැදගත්කම සඳහන් කරන්න.

1. පෙක්ටීන්
2. සෝඩියම් බෙන්සොඒට්

(iii) (a) ආහාරවල අගය වැඩි කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(b) ආහාරවල අගය වැඩි කිරීම සඳහා භාවිත කරනු ලබන උපක්‍රම දෙකක් ලියන්න.

(c) පහත දැක්වෙන ආහාරවල අඩංගු අහිතකර රසායන ද්‍රව්‍ය බැගින් සඳහන් කරන්න.

1. මඤ්ඤොක්කා අල
2. සෝයා බෝංචි බීජ

**06.** ශ්‍රී ලංකාවේ නූතන කෘෂි කර්මාන්තයේ ප්‍රධාන ඉලක්කයක් වන්නේ රට, ආහාරවලින් ස්වයංපෝෂිත තත්ත්වයට පත් කර ගැනීමයි. නිසි පරිදි පැළෑටි සංරක්ෂණ ක්‍රම භාවිත කිරීම මගින් බෝග අස්වනුවල ගුණාත්මකබව හා ප්‍රමාණාත්මකබව ඉහළ නංවා ගත හැකිය.

(i) (a) "පළිබෝධ" යන්න හඳුන්වන්න.

(b) වී වගා ක්ෂේත්‍රයකට පිටතින් වල් පැළෑටි බීජ හෝ කොටස් ඇතුළු වීම වැළැක්වීමට, යොදා ගත හැකි පරිසර හිතකාමී ක්‍රම දෙකක් ලියන්න.

(ii) (a) ශාකවලට වැළඳෙන ඇතැම් රෝග, වාහක කෘමීන් මගින් ව්‍යාප්ත වේ. රෝග වාහක කෘමීන් සඳහා නිදසුන් දෙකක් ලියන්න.

(b) ශාකවලට වැළඳෙන දිලීර රෝගවලට පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(c) තවාන් පැළවලට වැළඳෙන "දියමලන් කෑම" රෝගය පාලනය කිරීම සඳහා සුදුසු ක්‍රම දෙකක් ලියන්න.

(iii) (a) වගා භූමිය තුළ සිටින කෘමි පළිබෝධ පාලනය කර ගැනීම සඳහා, අනුගමනය කළ හැකි පරිසර හිතකාමී ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(b) වී වගාවේ, කරල් කිරි වදින අවස්ථාවේ දී බහුලව හානි සිදු කරන කෘමියා නම් කරන්න.

**07.** වර්තමානයේ, ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලනය රාජ්‍ය හා පෞද්ගලික අංශ මගින් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

(i) (a) සත්ත්ව පාලනය නිසා ලැබිය හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(b) සත්ත්ව පාලනය, අප රට තුළ ව්‍යාප්ත කිරීම සඳහා ඇති විභවයට නිදසුන් දෙකක් ලියන්න.

(ii) (a) ගවයින්, නිවාස තුළ ඇති කිරීමෙන් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න.

(b) පහත සඳහන් වන්නේ, ගව, එළු හා කුකුළු වරිග කිහිපය කි. ඔවුන් ඇති කරනු ලබන ප්‍රධාන අරමුණ එම වරිගය ඉදිරියෙන් ලියා දක්වන්න.

- කිලාරි -
- සානන් -
- ෆ්‍රිෂියන් -
- R.I.R. –

(iii) (a) ගොවිපොළ හිමිකරුවෙක්, තම ගොවිපොළේ ඇති කරනු ලබන සතුන් පිළිබඳ පහත නිරීක්ෂණ සිදු කළේ ය.එක් එක් නිරීක්ෂණ අනුව ඊට බලපෑ හැකි හේතුව බැගින් සඳහන් කරන්න.

1. දෙනුන් ගේ කිරිවල ලේ කැටිති තිබීම.
2. මධ්‍යාහ්නයේ දී කිකිළියන් ගන්නා ආහාර ප්‍රමාණය අඩු වීම.
3. කිකිළියක් කටුව රහිත බිත්තරයක් දැමීම.
4. ලේ සහිත තද දුඹුරු පැහැති කුකුළු වසුරු (මල ද්‍රව්‍ය) තිබීම.

(b) කුකුළු නිවාසයක් සඳහා ස්ථානයක් තෝරා ගැනීමේ දී සැලකිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

(c ) කුකුළු පාලනයේ දී පැටවුන් ගේ හොට කැපීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න.

# අ.පො.ස. ( සා.පෙළ ) පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2018

## කෘෂිකර්ම හා ආහාර තාක්ෂණය (81)

1 පත්‍රය - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 3 | 21 | 3 | 31 | 2 |
| 2 | 2 | 12 | 1 | 22 | 1 | 32 | 2 |
| 3 | 4 | 13 | 2 | 23 | 3 | 33 | 2 |
| 4 | 3 | 14 | 4 | 24 | 3 | 34 | 1 |
| 5 | 1 | 15 | 3 | 25 | 4 | 35 | 2 |
| 6 | 3 | 16 | 1 | 26 | 4 | 36 | 3 |
| 7 | 2 | 17 | 4 | 27 | 1 | 37 | 1 |
| 8 | 2 | 18 | 4 | 28 | 3 | 38 | 4 |
| 9 | 4 | 19 | 2 | 29 | 4 | 39 | 2 |
| 10 | 3 | 20 | 1 | 30 | 3 | 40 | 4 |

**කෘෂි විද්‍යාව**

**ව්‍යුහගත රචනා ප්‍රශ්න සඳහා ලකුණු පටිපාටිය**

01.

i. වසුන් යෙදීම, කාබනික ද්‍රව්‍ය එක් කිරීම, බිංදු ජල සම්පාදන ක්‍රම යෙදීම. (ලකුණු 1x2 = 2)

ii.

| | | |
|---|---|---|
| වර්ෂාපතනය | - | සරල වර්ෂාමානය , ස්වයංක්‍රිය වර්ෂාමානය |
| උෂ්ණත්වය | - | සාමාන්‍ය උෂ්නත්වමානය<br>උපරිම හා අවම උෂ්ණත්වමානය |
| ආලෝකය | - | සූර්ය විකිරණමානය<br>සූර්ය දීප්තමානය |
| සාපේක්ෂ ආර්ද්‍රතාවය | - | තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය |
| සුළඟ | - | අනිලමානය<br>සුළං දිශා දර්ශකය |

(ලකුණු ½ x4=2)

iii.

a. රතු දුඹුරු පස (ලකුණු 1)

b. ලවණ සේදීයාම අඩු ය, මැටි වැඩි ය, කැටායන හුවමාරු ධාරිතාව වැඩි ය.සාරවත්භාවය වැඩි ය. (ලකුණු 1)

iv.

| | | |
|---|---|---|
| ඉන්නල | - | ස්කන්ධ ආකන්ධ |
| ඉඟුරු | - | රෛසෝම |
| කිරි අල | - | කෝම |
| ගොටු කොළ | - | ධාවක |

(ලකුණු ½ x4=2)

v. ඉල් මැස්සා (ලකුණු 01)

පෙරමෝන උගුල් භාවිතය
එල ආවරණය කිරීම
පළිබෝධ හානි කරන ලද එල කොටස් වගා බිමෙන් ඉවත් කර වැළලීම (ලකුණු 1/2x2=1)

vi. සැල්වීනියා, ගිණි තණ, ජපන් ජබර, විඩේලියා, පාතීනියම්, ගඳපාන (ලකුණු 1x2)

vii. අඩු වියදමින්, ගුණාත්මකභාවයෙන් වැඩි ජලය ලබා ගත හැකි වීම.
මෙම ජලය ගොවිතැන් කටයුතු සඳහා මෙන්ම ගෘහස්ථ පරිභෝජනය සඳහා ද භාවිත කළ හැකි වීම.
ජලය රැස් කිරීම සඳහා දේශීය තාක්ෂණය හා සම්පත් යොදාගත හැකි වීම.
(ලකුණු 1x2=2)

viii. සාන්ද්‍ර ආහාර- බඩ ඉරිඟු, හාල් නිවුඩු, පොල් පුන්නක්කු
දල ආහාර- පිදුරු, තෘණ, රනිල, බෝග අවශේෂ (ලකුණු 1x2=2)

ix. යෝගට් සෑදීම
මී කිරි සෑදීම
ශීතනය
අධිශීතනය (ලකුණු 1x2=2)

x. බලශක්ති නිෂ්පාදනය සිදුවීම
පොහොර නිෂ්පාදනය සිදුවීම
අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සිදුවීම (ලකුණු 1x2=2)

(මුළු ලකුණු = 20)

**02.**

i. (a) සාපේක්ෂ ආර්ද්‍රතාවය (ලකුණු 01)

(b) A - වියළි බල්බ උෂ්ණත්වමානය
B - තෙත් බල්බ උෂ්ණත්වමානය (ලකුණු ½×2=1)

ii. (a) මද සුලඟින් ශාක පත්‍ර අවට වාතය හුවමාරුව සිදුවන බැවින් ප්‍රභාසංස්ලේෂණ වේගය වැඩි වී අස්වැන්න වැඩි වේ.

- මද සුළඟ බෝගවල පරාගනය සඳහා දායක වේ.
- උත්ස්වේදන වේගය වැඩි වීමෙන් ජලය හා ශාක පෝෂක අවශෝෂණය වැඩි වේ. (ලකුණු 1x2=2)

(b)

- උච්චත්වය
- මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය
- වන ගහණය
- අභ්‍යන්තර ජලාශ පිහිටීම (ලකුණු 1×2=2)

iii. (a) පාංශු වයනය (ලකුණු 01)

(b) එකම ගැඹුරකට වැඩි වාර ගණනක් පස පෙරළීම
පාංශු බාදනය අධික වීම
සෝඩියම් ලවණ අධික වීම
ජලවහනය දුර්වල වීම (ලකුණු 1x2=2)

(C) පාංශු සමූහන ඇති කිරීමට දායක වීම
පසේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි කිරීම
ශාක වර්ධනයට අවශ්‍ය පෝෂක රඳා තබා ගන්නා සංසටකයක් ලෙස ක්‍රියා කිරීම
පස මතුපිටින් ගලා යන ජලය ආපදාවය අඩු වී පාංශු බාදනය අඩු වීම
පාංශු ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනයට අවශ්‍ය උපස්ථරය ලෙස ක්‍රියා කිරීම
පසේ ජලවහනය දියුණු කිරීම
හියුමස් කලිල මගින් පසේ කලිල ගුණාංග වැඩි දියුණු කිරීම (පස සාරවත් වීම)
පසට පෝෂක සැපයීම (ලකුණු 1×2= 2)
(මුළු ලකුණු = 10)

03.

i. (a) ඒකාකාර වගාවක් පවත්වා ගත හැකි ය.
බීජ අපතේ යාම අඩු ය.
ශක්තිමත් හා නිරෝගී පැළ ක්ෂේත්‍රයේ සිටුවිය හැකි ය. (ලකුණු 1× 2 = 02)

(b) බීජ කුඩා නිසා බීජ අපතේ යයි.
කුඩා පැළ පරිසරයට ඔරොත්තු දීමේ හැකියාව අඩු ය. (ලකුණු 01)

ii. (a) වගා කර ඇති බෝගය
බෝගයේ වර්ධන අවස්ථාව
අවශ්‍ය ජල ප්‍රමාණය, ජල සම්පාදන ක්‍රමය
ජල ප්‍රභවයේ ස්වභාවය (ලකුණු 03)

(b) පසට කාබනික ද්‍රව්‍යය වසුන් කිරීම
පසට කාබනික ද්‍රව්‍ය යෙදීම
වල් පැළ පාලනය (ලකුණු 01)

(iii) (a) මූලික පොහොර හා මතුපිට පොහොර (ලකුණු ½ ×2 = 2)

(b) බෝගයේ අවශ්‍යතාව අනුව යෙදිය හැකි ය.
මිළ අඩු ය.
පසේ තත්ත්වය අනුව පොහොර යෙදිය හැකි ය.
පොහොරවලට අපද්‍රව්‍ය එකතු වීම අඩු ය. (ලකුණු 02)
(මුළු ලකුණු = 10)

04.

i. (a) රූපය ඇඳීමට - (ලකුණු 01) කොටස් නම් කිරීමට - ¼×4 – 01 (ලකුණු 02)
(b) ඉහළ උෂ්ණත්වය, ඉහළ සාපේක්ෂ ආර්ද්‍රතාව (ලකුණු ½×2=1)

ii. A – භ්‍රෑණ පෝෂය B – බීජාංකුරය C – බීජ පත්‍රය D - බීජ මූලය (ලකුණු ¼×4=1)

(b) භ්‍රෑණ පෝෂය (ලකුණු 01)
(c) බීජයේ ජීව්‍යතාවය, තෙතමනය, ජලය, වාතය, ප්‍රශස්ත උෂ්ණත්වය, ආලෝකය (ලකුණු ½×2=1)

iii. (a) නිර්පාංශු වගාව (ලකුණු 01)

(b) ඇල්බර්ට් පොහොර මිශ්‍රණය, ඇලන් කූපර් මිශ්‍රණය (ලකුණු 1×2= 2)

(c) මනා වාතනයක් පැවතීම
මනා ලෙස ජලවහනය සිදු වීම
ජලය රඳවා ගැනීමේ හැකියාව තිබීම
ස්වාරක්ෂක ගුණය පැවතීම (ලකුණු 1½×2=1)
(මුළු ලකුණු = 10)

05) i) (a) B, C (ලකුණු 1/2X2 = 01)
(b) D, E (ලකුණු ½X2 = 01)

D - අඹ අස්වැන්න නෙලූ පසු කිරි ඉවත් වන ලෙස පිරිසිදු මඳ උණුසුම් වතුරින් සේදීම
E - හොඳින් පරිණත වූ ඵල ඉදීමට පෙර අස්වනු නෙළීම

(ඵල කොළ පැහැයේ සිට කහ පැහැයට හැරීම ආරම්භ වන විට අස්වනු නෙළීම)

ii) (a) නාස්තිය අවම වීම
කාලීනව ලැබෙන අස්වනු අවාරයේ දී භාවිතය
පාරිභෝගික රුචිය ඇති කෙරෙන විවිධ නිෂ්පාදන සැකසීම
භාවිතයේ පහසුව / රැකියා ලැබීම/ ආහාර නරක් වීම පාලනය (ලකුණු 1X2 = 02)

(b) 1. පෙක්ටින් - ජෑම්වලට අවශ්‍ය ඝන බව ලබා දීමට
2. සෝඩියම් බෙන්සොඒට් - ජෑම් නරක් නොවී කල් තබා ගැනීමට (පරිරක්ෂකයකි)
(ලකුණු 1X2 = 02)

iii. (a) ආහාරවල ගුණාත්මකබව වැඩි කර ගැනීම සඳහා පෝෂකයක් හා පෝෂක කිහිපයක් සම්මත ප්‍රමාණවලින් ආහාරයට එක් කර ගැනීම (ලකුණු 01)
(b) සරු කිරීම, ප්‍රබල කිරීම (ලකුණු 1X2 = 02)
(c) 1. ලිනමරින්
2. ට්‍රිප්සීන් එන්සයිමය නිශේධක ද්‍රව්‍යයක් අඩංගුය (ලකුණු 1/2X2 = 01)
(මුළු ලකුණු = 10)

06)

i. (a) මිනිසාට හෝ මිනිසා විසින් වගා කරනු ලබන බෝගවලට හෝ ඇති කරනු ලබන සතුන්ට හෝ පරිහරණය කරන ද්‍රව්‍යවලට හෝ හානි පමුණුවන ඕනෑම ජීවියෙකු පළිබෝධ වේ. (ලකුණු 01)

(b) වල් පැළෑටි බීජවලින් තොර බීජ වැපිරීමට හෝ සිටුවීමට ගැනීම
වාරි ඇළ මාර්ග වල් පැළෑටිවලින් තොරව පවත්වා ගැනීම
පිරිසිදු කෘෂි උපකරණ භාවිතය
ජලය බැඳ තැබීම (ලකුණු 01X2 = 02)

ii. (a) කීඩෑවන්, කුඩිත්තන්, සුදු මැස්සා (ලකුණු 1/2X2 = 01)

(b) පුල්ලි ඇති වීම, අංගමාරය, මැලවීම, ගඩු ඇති වීම, පුස්/ පිටි වැනි ද්‍රව්‍යයන් තිබීම, තෙත් හා වියළි කුණු වීම මලකඩ වැනි පැල්ලම් ඇති වීම (ලකුණු 1/2X2 = 01)

(c) නීරෝගී බීජ රෝපණය කිරීම, බීජ ප්‍රතිකාර කිරීම, පස ජීවානුහරණය කිරීම, තවාන් පැළ පරතරය වැඩි කිරීම, දිළීර නාශක යෙදීම (ලකුණු 1X2 = 02)

iii. (a) පස පෙරලීම, පස ජීවානුහරණය, බෝග මාරුව, යාය එකට වගා කිරීම, පළිබෝධයන් අතින් අල්ලා විනාශ කිරීම, උගුල් භාවිතය, කෘමි විකර්ශක බෝග සිටුවීම, ඇම තැබීම, ඵල ආවරණය කිරීම, පෙරමෝන උගුල තැබීම (ලකුණු 1/2X2 = 01)

(b) ගොයම් මකුණා (ලකුණු 1X2 = 02)

(මුළු ලකුණු = 10)

07. (i)

(a) 1. සත්ත්ව නිෂ්පාදන ප්‍රෝටීන ප්‍රභවයක් ලෙස යොදාගත හැකි වීම
2. ආදායම් ලැබීම සහ රැකියා සැපයිය හැකි වීම
3. අතුරුණු සහ මලද්‍රව්‍ය කාබනික පොහොරක් ලෙස භාවිත කළ හැකි වීම
4. ජීව වායු නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය ලබා ගත හැකි වීම
5. බෝග වගාවට නුසුදුසු භූමි සත්ත්ව පාලනයට යොදා ගත හැකි වීම
6. විවිධ කර්මාන්තවලට අමුද්‍රව්‍ය සැපයිය හැකි වීම (ලකුණු 1 /2X2 = 01)

(b) 1. සත්ත්ව ආහාර ලෙස තෘණ ලබා ගත හැකි ඉඩම් තිබීම
2. බෝග නිෂ්පාදන අතුරුඵල සහ මුළුතැන්ගෙයින් ඉවතලන අපද්‍රව්‍ය ආහාර ලෙස යොදා ගත හැකි වීම
3. සත්ත්ව නිෂ්පාදන සඳහා විශාල ඉල්ලුමක් තිබීම
4. රාජ්‍ය අනුග්‍රහය තිබීම
5. ගැලපෙන දේශගුණික තත්ත්ව සැපයීම (ලකුණු 1/2X2 = 01)

(ii)

(a) 1.අහිතකර දේශගුණික තත්ත්වවලින් ආරක්ෂාව
2. සොර සතුරු උපද්‍රව්‍ය මගින් ආරක්ෂාව
3. රාත්‍රියට ක්‍රමවත්ව ආහාර, ජලය සැපයිය හැකි වීම
4. සතුන් පිරිසිදුව තබා ගත හැකි වීම
5. කිරි දෙවීම, අප ද්‍රව්‍ය ඉවත් කිරීම වැනි කටයුතු පහසු වීම
6. සතුන්ට සුව පහසුව සැලසිය හැකි වීම (ලකුණු 1/2X2 = 01)

(b) කිලාරි - ශ්‍රමය/ බර ඇදීම සඳහා
සානන් - කිරි සඳහා
ප්‍රීෂියන් - කිරි සඳහා
RIR - බිත්තර සඳහා (ද්වි කාර්යය) (ලකුණු 1/2X4 = 02)

(iii)

(a) 1. දෙනට බුරුළු ප්‍රදාහය වැළදී තිබීම
2. වැඩි උණුසුම නිසා ආතතියට (stress) ලක්ව තිබීම
3. ආහාරයේ Ca ඌන වීම
4. කොක්සිඩියෝසීස් රෝගය ආසාදනය (ලකුණු 1/2X4 = 02)

(b) 1. ජල වහනය සතුටුදායක ස්ථානයක් වීම
2. වාතාශ්‍රය හොඳින් ලැබීම
3. මාර්ග පහසුකම්, විදුලිය, ජල පහසුකම්, වැනි යටිතල පහසුකම් සහිත වීම (ලකුණු1/2X4 = 02)

(c) 1. ඇන කොටා ගැනීම අඩු කිරීම
2. ආහාර අපතේ යාම අඩු කිරීම (ලකුණු 1/2X2 = 01)
(මුළු ලකුණු = 10)


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440